# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2196/52 - 2020 ඔක්තෝබර් මස 09 වැනි සිකුරාදා - 2020.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය.: කේ.ඩී.එස්/තුම්පනේ/04/01/6/5/(2019/02).
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.: 4-3/7/2016/HW/132.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 372 ගුණදහ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගුණදහ ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 162/11/11 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි:

1. **කැබලි අංක 386**
ඉඩමේ නම: මැදගොඩවත්ත, නාගස්හේනවත්ත, කවුඩැල්ල, නාගස්හින්න ; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: විල්බාගෙදර ඉහළ වලව්වේ ගාමිණී වැත්තෑව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5318

2. **කැබලි අංක 387**
ඉඩමේ නම: මැදගොඩවත්ත, නාගස්හේනවත්ත, කවුඩැල්ල, නාගස්හින්න; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: විල්බාගෙදර ඉහළ වලව්වේ පණ්ඩුක වැත්තෑව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0758.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2020 නොවැම්බර් මස 09 වැනි දින පෙ. ව. 10.00 ට තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2020 ඔක්තෝබර් මස 26 වන දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වාභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

එස්.එම්.සී.ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම්,
තුම්පනේ.

2020 සැප්තැම්බර් මස 25 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-928



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශුද්ධිපත්‍රයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: ආණ/ඉ/එල්/ඒ4609.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 03/J/85/IR/43.

2011.09.09 දින 1722/23 අංක දරන 7 වැනි වගන්තිය සහිත *ගැසට් පත්‍රයේ පළවූ* පහත ඉඩම්වලට අදාළ හිමිකම් පරීක්ෂණ දිනය පහත පරිදි සංශෝධනය කරනු ලබයි.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

පුත්තලම දිස්ත්‍රික්කයේ, ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරඹෑපත්තුව සුළු කොට්ඨාසයේ, මාවතගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අවසාන ගම් පිඹුරු අංක 3230හි කැබලි අංක 21, 22, 23, 24, 25 1/2, 25 2/2, 26, 27 දරන ප්‍රමාණයෙන් හෙක්. 3.24කට මායිම්.

1. **කැබලි අංක 21 - හැලඹගහ යාය - ප්‍රමාණය හෙක්. 0.240**

*උතුරට* : මැරුංගොඩ ගම් මායිම, කැබලි අංක 17 සහ 25 2/2; *නැගෙනහිරට* : කැබලි අංක 17 සහ 25 2/2 සහ 25 1/2; *දකුණට* : කැබලි අංක 24, 23, 22 සහ 17; *බටහිරට* : කැබලි අංක 17.

2. **කැබලි අංක 22 - හැලඹගහ යාය, මාවතගම කුඹුරු - ප්‍රමාණය හෙක්. 0.160**

*උතුරට* : කැබලි අංක 21 සහ 23; *නැගෙනහිරට* : කැබලි අංක 23 සහ 19; *දකුණට* : කැබලි අංක 19, 18 සහ 8; *බටහිරට* : කැබලි අංක 18, 8 සහ 17.

3. **කැබලි අංක 23 - හැලඹගහ යාය, මාවතගම කුඹුරු - ප්‍රමාණය හෙක්. 0.080**

*උතුරට* : කැබලි අංක 21 සහ 24; *නැගෙනහිරට* : කැබලි අංක 24; *දකුණට* : කැබලි අංක 19 සහ 22; *බටහිරට* : කැබලි අංක 22 සහ 21.

4. **කැබලි අංක 24 - හැලඹගහ යාය, මාවතගම කුඹුරු - ප්‍රමාණය හෙක්. 0.192**

*උතුරට* : කැබලි අංක 21 සහ 25 2/2 සහ 25 1/2; *නැගෙනහිරට* : කැබලි අංක 25 1/2 සහ 19; *දකුණට* : කැබලි අංක 19 සහ 23; *බටහිරට* : කැබලි අංක 24 සහ 21.

5. **කැබලි අංක 25 1/2 - හැලඹගහ යාය, මාවතගම කුඹුරු - ප්‍රමාණය හෙක්. 0.320**

*උතුරට* : කැබලි අංක 25 2/2 සහ 26; *නැගෙනහිරට* : කැබලි අංක 26 සහ 19; *දකුණට*: කැබලි අංක 19 සහ 24; *බටහිරට* : කැබලි අංක 24 සහ 21.

6. **කැබලි අංක 25 2/2 - හැලඹගහ යාය, මාවතගම කුඹුරු - ප්‍රමාණය හෙක්. 0.192**

*උතුරට*: කැබලි අංක 17, මැරුංගොඩ ගම් මායිම සහ කැබලි අංක 26; *නැගෙනහිරට*: කැබලි අංක 26; *දකුණට*: කැබලි අංක 25 1/2, 24 සහ 21; *බටහිරට*: කැබලි අංක 21 සහ 17.

7. **කැබලි අංක 26 - හැලඹගහ යාය, මාවතගම කුඹුරු - ප්‍රමාණය හෙක්. 1.696**

*උතුරට*: මැරුංගොඩ ගම් මායිම, කැබලි අංක 6 සහ 27; *නැගෙනහිරට*: කැබලි අංක 6, 7, 27, මැරුංගොඩ ගම් මායිම සහ කැබලි අංක 19; *දකුණට*: කැබලි අංක 19 සහ 25 1/2; *බටහිරට*: කැබලි අංක 25 1/2 සහ 25 2/2.

8. **කැබලි අංක 27 - හැලඹගහ යාය, මාවතගම කුඹුරු - ප්‍රමාණය හෙක්. 0.360**

*උතුරට*: කැබලි අංක 6 සහ 7; *නැගෙනහිරට*: කැබලි අංක 7 සහ මැදගම ගම්මායිම; *දකුණට*: කැබලි අංක 26; *බටහිරට*: කැබලි අංක 26.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 දෙසැම්බර් මස 10 වැනි දින පූ. භා. 10.00ට ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020 දෙසැම්බර් මස 10 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩබ්. පී. දීපිකා චාන්දනී,
ප්‍රාදේශීය ලේකම්,
ආණමඩුව.

2020 සැප්තැම්බර් මස 21 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-929

---

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: කඩු/ඉඩම්/04/136C/RDA
පැරණි -අත්/කේඩී/136/එච්.ඩබ්.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය*: 4-3/6/2014//HW/(205)1.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 2061/40 හා 2018.03.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* මු. පි. කො. 9713හි කැබලි අංක 29හි ප්‍රමාණය 0.0025 වශයෙන් සඳහන් වුවද එහි ප්‍රමාණය 0.0000 (ව. මී. 0.25) යනුවෙන් නිවැරදි විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ඩී. වයි. ආනන්දනී,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2020 සැප්තැම්බර් මස 30 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කඩුවෙල.

10-930

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.